# දැන්වීමයි.

## බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ

## සෞඛ්‍ය රියදුරු තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවීම

## (විවෘත බඳවා ගැනීම)

බස්නාහිර පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සෞඛ්‍ය රියදුරු තනතුරු පුරප්පාඩු 23 ක් පිරවීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාතේ පදිංචි ශ්‍රී ලාංකික (පිරිමි) පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

- වැටුප් පරිමාණය :
  ඒකාබද්ධ වැටුප - PL-03-2016
  රු. 25,790 -10x270 – 10x300 – 10x330 - 12×350 - රු. 38,990/-
  (රා.ප.ච. අංක:03/2016 හා උපලේඛන II හි සඳහන් පරිදි වැටුප් ගෙවනු ලැබේ.)

**01. බඳවා ගැනීමේ මූලික සුදුසුකම්:**

- අධ්‍යාපන සුදුසුකම් :
  අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් (06) සමත්වී තිබීම. මින් විෂයයන් පහක් (05) එකවර එක් වතාවකදී සමත් විය යුතුය.

- වෘත්තීය සුදුසුකම් :
  තාර බර හොණ්ඩර 34 ට වැඩි මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32ට වඩා ගෙන යා හැකි බලපත්‍ර ලබා ඇති බස්රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද නිපුණතාවය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතුය. (පැරණි රියදුරු බලපත්‍රය අනුව A පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව D පන්තියේ වලංගු බලපත්‍රයක් ලබා තිබිය යුතුය.)

- පළපුරුද්ද :
  රියදුරෙකු ලෙස අවම වශයෙන් වසර පහක (05) ක සේවා පළපුරුද්දක් තිබිය යුතු අතර ඉන් වසර දෙකක් (02) බර වාහන පැදවීම සම්බන්ධයෙන් විය යුතුය. (සහතික මගින් සනාථ කළ යුතුය.)

- කායික සුදුසුකම් :

i. සෑම අපේක්ෂකයෙකුම බස්නාහිර පළාත තුල ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත්, දිවා රාත්‍රී කාලවල රාජකාරි ඉටු කිරීමටත් සේවා අවශ්‍යතාවය මත පැය 24 සේවා මුරවල රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

ii. අවම උස අඩි 05 යි අඟල් 2 ½ ක් විය යුතුය.

iii. ඇස් පෙනීම සම්බන්ධයෙන් පහත සඳහන් උපමාන වල දක්වා ඇති යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

- ඇස්පෙනීම සම්බන්ධව ලංකා අක්ෂි වෛද්‍ය සංගමය පිළිගත් නිර්ණායක වන වම් ඇස හා දකුණු ඇස 6/9 සීමාව තුළ පැවතිය යුතුය.
- වර්ණ අන්ධතාවය පරීක්ෂා කිරීමේ දී ලංකා අක්ෂි වෛද්‍ය සංගමයේ නිර්දේශිත නිර්ණායකයන් අනුව වර්ණ අන්ධතාවය නොතිබිය යුතුය.

**04.** විභාග ගාස්තු

විභාග ගාස්තු රු.350/- කි. මෙම විභාග ගාස්තු පළාත් ආදායම් ශීර්ෂ 20-03-02-99 ට බැර වන පරිදි ළඟම පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා ලබා ගන්නා ලද කුවිතාන්සිය අයදුම්පතට අමුණා එවිය යුතුය. මෙසේ මුදල් ගෙවා ලබා ගත් ලදුපත් හැර වෙනත් ආයතන වලට මුදල් ගෙවා ලබාගත් ලදුපත් හෝ මුදල් ඇණවුම් භාර ගනු නොලබන අතර, කවර හෝ කරුණක් නිසා විභාගයට පෙනී නොසිටින අයදුම්කරුවන්ට විභාග ගාස්තු සම්පූර්ණ වශයෙන් හෝ ඉන් කොටසක් හෝ ආපසු ගෙවනු නොලැබේ. තවද මෙම විභාගය වෙනුවෙන් ගෙවනු ලබන ගාස්තු වෙනත් විභාගයක් වෙනුවෙන් පැවරීමට ද නොහැකිය.

**05.** අයදුම්පත් එවනු ලබන පිළිවෙල

අයදුම්කරුවන් තම අයදුම්පත මීට අමුණා ඇති ආදර්ශ අයදුම්පතට අනුව ඒ4 ප්‍රමාණයේ (සෙ.මී. 21-39) කඩදාසියක දෙපැත්ත ප්‍රයෝජනයට ගනිමින් අපේක්ෂකයා විසින්ම නිවැරදිව හා පැහැදිලිව සම්පූර්ණ කල යුතුය. සියලුම අයදුම්කරුවන් තම අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් **2019.06.25** දිනට පෙර ලේකම්, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශය (බ.ප.) 8 වන මහල, ප්‍රධාන ලේකම් කාර්යාල ගොඩනැගිල්ල, අංක 204, ඩෙන්සිල් කොබ්බැකඩුව මාවත, බත්තරමුල්ල යන ලිපිනයට එවිය යුතුය. <u>ලිපි කවරයේ වම් පස ඉහල කෙළවරේ තමන් අයදුම් කරන තනතුර සඳහන් කල යුතු ය.</u> අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පසු ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**06.** අත්සන සහතික කිරීම

අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන්වහන්සේ නමක් හෝ අන්‍යාගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයෙකු, රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, නීතිඥවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, කොට්ඨාශයේ ග්‍රාම නිලධාරිවරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කල තනතුරක් දරණ නිලධාරියෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික තනතුරක් දරණ නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

**07.** රෙගුලාසි වලින් විධි විධාන සලසා නොමැති කරුණක් වෙතොත් එය බස්නාහිර පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු හා සභා කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් තීරණය කරනු ලැබේ.

එච්.ජී.ජී.ජේ. ධර්මසේන,<br>
ලේකම්,<br>
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබ සාධන,<br>
පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු<br>
සහ සභා කටයුතු අමාත්‍යාංශය (බ.ප.)